CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

***2018 පෙබරවාරි 28, කොළඹ, ශ්‍රී ලංකාව:*** පසුගිය පෙබරවාරි 26 වන දින අම්පාර නගරයේ පිහිටි මුස්ලිම් දේවස්ථානයකට සහ ව්‍යාපාර ස්ථාන කිහිපයකට සිදු කල පහරදීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෙස දැඩිව හෙළා දකින අතරම, අම්පාර ප්‍රදේශයේ තවත් එවැනි හිංසනීය සිදුවීම් වැලැක්වීමට සහ වරදකරුවන්ට එරෙහිව නිතීය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරණ මෙන් අදාළ බලධාරීන්ගෙන් ඕනෑකමින් ඉල්ලා සිටියි.

පශ්චාත් යුධ සමය තුළ සුළුතර ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් සංවිධානාත්මක ලෙස වෛරී ව්‍යාපාර මතු වු අතර, ශ්‍රී ලංකාවේ පවතින නීතියට අනුව මෙසේ ඇති වූ බොහෝ සිදුවීම්වලට අදාල පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සහ ඔවුන්ට විරුද්ධව නඩු පැවැරීම සිදු නොවීය. තව ද මෙම සිදුවීම්වලට අදාලව වීඩියෝ පටිගත කිරීම් බොහෝ අවස්ථාවලදී එම ක්‍රියාවන් සිදු කල කණ්ඩායම් හෝ ඔවුන් සමඟ කටයුතු කල අය විසින් කිසිදු චකිතයකින් තොරව සමාජගත කර ඇත. පොලීසිය විසින් දිගින් දිගටම නීතිය ක්‍රියාත්මක කිරීම පැහැර ඇති පසුබිමක් තුළ, මේ සඳහා මැදිහත් වී නීතිය සාධරණ ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිතීය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා වන අග්‍රමාත්‍යතුමාට ඕනෑකමින් ප්‍රකාශ කර සිටි.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඇතුළු රජයේ ප්‍රබල පාර්ශවයන් විසින් අම්පාරේ ඇති වු තත්වය හෙළා දකිමින් ප්‍රකාශ සිදු කර ඇත. ජනාධිපතිතුමා ඊයේ (27 දින) ''සංහිඳියාව හා සහජීවනය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය'' එළිදක්වන අවස්ථාවට සහභාගී වෙමින් එසේ ප්‍රකාශයන් සිදු කර ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රකාශවලට අනුරූපිව ඉදිරියේ දී මෙවැනි සිදුවීම් වලක්වා ගැනීමටත්, මෙවැනි සිදුවීම් වලට සම්බන්ධ පුද්ගලයන් නීතිය ඉදිරියට පැමිණවීමටත්, රජය, සංහිඳියාව සහ සහජීවනය වෙනුවෙන් කටයුතු කරණ බවට රටේ සියළු ජන කොටස්වලට සනාථ කිරීමටත්, කටයුතු කිරීම අත්‍යාවශය වේ. ශ්‍රී ලංකාව සිය 70 වන නිදහස් දිනය සමරණ අවධියේ මේ සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම රට තුළ සාමය හා සංහිඳියාවට ඇති බලාපොරොත්තු නිශේදනය කරනු ඇත.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org